## සහකාර කොමසාරිස් කාර්යාල වලින් ලබා දෙන සේවාවන්

- අදාල දිස්ත්‍රික්කය බල ප්‍රදේශය වන ලෙස ඉල්ලීම් කරන සියළුම ආකාරයේ සමුපකාර සමිති සුදුසුකම් සපුරා ඇති නම් ලියාපදිංචි කිරීම.
- ලියාපදිංචි කර ඇති සමිති අධීක්ෂණය කිරීම හා නියාමනය කිරීම
- සමිතිවල ගිණුම් වර්ෂය අවසාන වූ විට ව්‍යවස්ථාපිත විගණනය සිදු කිරීම.
- අක්‍රීය සමිති ඈවර කිරීම සඳහා සමුපකාර සංවර්ධන කොමසාරිස් (බ.ප) අවශ්‍ය නිර්දේශ හා තොරතුරු ලබාදීම.
- සමුපකාර සමිති වල අතුරු ව්‍යවස්ථා,කාරක නියෝග,ග්‍රාමීය බැංකු කාර්ය රීති සංශෝධනය කිරීම.
- සමුපකාර සමිති වල ස්ථාවර වත්කම්, චංචල දේපළ අත්පත් කරගැනීම් ,බද්ධට දීම,කුලියට දිම හා බැහැර කිරීම සඳහා අවශ්‍ය අනුමැතිය ලබාදීම හෝ මුල්‍ය වටිනාකම ඉක්ම වූ විට සමුපකාර සංවර්ධන කොමසාරිස් (බ.ප) ට අවශ්‍ය නිර්දේශ ලබා දීම.
- සමුපකාර සමිති වල සංවර්ධන ව්‍යාපෘති අනුමත කිරීම හා මූල්‍යාධාර ලබාගන්නේ නම් අවශ්‍ය නිර්දේශ ලබාදීම හා එකී ව්‍යාපෘති වල පසුවිපරම් සිදු කිරීම.
- සහකාර කොමසාරිස් වරයාගේ අභිමතය පරිදි සමුපකාර සමිති වල මහාසභා , කාරක සභා,අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් කැඳවීම හා උපදෙස් ලබාදීම.
- සමුපකාර සමිතිවල නිලවරණ කටයුතු මෙහෙයවීම, එමඟින් අධ්‍යක්ෂ මණ්ඩල , කාරක සභා තෝරාගැනීමට කටයුතු කිරීම.
- අධ්‍යක්ෂක මණ්ඩල පත්කිරීම් සඳහා අවශ්‍ය නිර්දේශ හා රහස්‍ය වාර්තා කොමසාරිස් වරයාට ලබාදීම.
- සමුපකාර සමිති වල සියළුම ණය ආරවුල් තීරකකරණය සඳහා භාරගැනීම හා විභාග කිරීම.
- මුදල් අයනොවූ තීරක තීන්දු සමිති වල ඉල්ලීම පරිදි උසාවි බලගන්වා සමිති වලට මුදල් අයකර දීම.
- සමුපකාර සමිති හා වෙනත් පාර්ශවයන් අතර පැන නැගෙන ආරවුල් වලදී මැදිහත් කරුවකු වශයෙන් කටයුතු කිරීම.
- සමුපකාර සමිතිවලට අදාලව ඉදිරිපත්වන පෙත්සම් සම්බන්ධයෙන් පරීක්ෂණ පැවැත්වීම , නිගමන හා නිර්දේශ ඉදිරිපත් කිරීම සහ අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම.
- සමුපකාර සමිතිවල ඉතිරිලාභ බෙදීම සඳහා අනුමැති ලබාදීම.
- සමුපකාර සමිතිවලට අදාලව සංඛ්‍යාලේඛණ හා තොරතුරු එක්රැස් කිරීම, විශ්ලේෂණය කිරීම හා ඒවා අවශ්‍ය ආයතන වලට ලබාදීම.
- සමුපකාර සමිතිවල සේවකයන්ට, කාරක සභිකයන්ට ,අධ්‍යක්ෂ මණ්ඩලයට අවශ්‍ය පුහුණු වැඩසටහන් සැලසුම් කිරීම හා සංවිධානය කිරීම.
- සමුපකාර සමිතිවල සේවක පිරිස් බලතක්සේරු සකස් කරවීම හා එය අනුමැතිය සඳහා අවශ්‍ය නිර්දේශ ලබාදීම.
- සේවක බඳවා ගැනීම් සඳහා සමුපකාර සමිති වලට අනුමැතිය ලබාදීම.
- සමුපකාර සමිති වල අධ්‍යක්ෂ මණ්ඩලයේ හෝ කාර්ය මණ්ඩලයේ සාමාජිකයන් විදේශ ගතවීමට නිර්දේශ හා අවශ්‍ය විදේශ නිවාඩු ලබාගැනීමට නිර්දේශයන් ලබාගැනීම.

- අවශ්‍යතාවය පරිදි සමුපකාර සමිතිවල වාර්ෂික ,අර්ධ වාර්ෂික හා හදිසි තොග ගණන් ගැනීම සිදුකිරීම.
- සමුපකාර සමිති මූල්‍ය ආයෝජන සිදුකිරීමේදී අවශ්‍ය අනුමැතිය ලබාගැනීමට නිර්දේශ ලබාගැනීම.
- සමුපකාර සමිති වල අවශ්‍යතාවය පරිදි බැංකු ගිණුම් සඳහා ආදර්ශ අත්සන් කාඩ් සහතික කිරීම.
- අවශ්‍යතාවය පරිදි  සමුපකාර සමිති වලට දිගුකාලීන ණය, අයිරා ණය පහසුකම් ලබාගැනීමේදී අවශ්‍ය නිර්දේශ ලබා දීම.
- හදිසි පරීක්ෂණ සමුපකාර සමිති සම්බන්ධයෙන් සිදුකිරීම හා ඒවායින් හෙළිදරවු වන කරුණු අනුව ඉදිරි කටයුතු සිදු කිරීම.
- විවිධ සේවා සමුපකාර සමිති වල මාසික F 28  මෙහෙයුම් වාර්තාව සමාලෝචනය කිරීම හා අඩුපාඩු නිවැරදි කිරීමට උපදෙස් සැපයීම.
- විවිධ සේවා සමුපකාර සමිති මාසිකව මිලදී ගනුලබන වෙළඳ ද්‍රව්‍ය වල මිල තොරතුරු රැස්කිරීම හා මිල කමිටු මඟින් විධිමත් මිලදීගැනීමේ ක්‍රමයක් ක්‍රියාත්මක කරවීම
- සහකාර කොමසාරිස් කාර්යාල වලට අදාල කාර්යන් සම්බන්ධයෙන් ජනතාව ඉල්ලා සිටින තොරතුරු ලබාදීම.